# ක්‍රමවේදය:-පරිසර ආරක්ෂන බලපත්‍රයක් ලබා ගැනීම

***සැලකිය යුතුයි:-ඔබ විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්තය2022/01/27 දිනැති අංක 2264/18 දරණ ගැසට් නිවේදනයේ (ඇ) බාණ්ඩයේ සදහන් පරිසර ආරක්ෂන බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත ක්‍රියාකාරකමක්දැයි හදුනාගත යුතුය.(ඇමුණුම)**

01. මධ්‍යම පරිසර අධිකාරිය මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ මෙම වෙබ් අඩවිය මගින් බාගත කර ගන්නා ලද පාරිසරික ආරක්ෂන බලපත්‍රය නිවැරදිව සම්පූර්න කර පහත ලියකියවිලි සමග ආයතනය වෙත ඉදිරිපත් කිරීම.

    - කර්මාන්තය පිහිටි ස්ථානය දක්වන මාර්ග සටහන
    - ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය
    - කොලොන්න ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කල වෙළද බලපත්‍රය හෝ මුදල් ගෙවන ලද කුවිතාන්සිය
    - අනුමත ගොඩනැගිලි සැලැස්ම/අනුකූලතා සහතිකය
    - ඉඩමෙහි මිනින්දෝරු සැලැස්ම
    - අපද්‍රව්‍ය පිරිපහදු සැලැස්ම
    - ඉඩමෙහි ඔප්පුවේ පිටපතක් හෝ පැවරීම් සහතිකයේ පිටපතක් හෝ වෙනත් හිමිකම් දැක්වෙන ලියවිල්ලක්
    - වෙනත් අදාල අනුමැතීන්

02. අදාල කර්මාන්තය සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂනය සිදු කිරීම.

03. ක්ෂේත්‍ර පරීක්ෂන වාර්තාව ප්‍රගති සමාලෝචන කමිටුවට ඉදිරිපත් කිරීම.

04. ප්‍රගති සමාලෝචන කමිටුව විසින් බලපත්‍රය ලබා දීම සුදුසුද නුසුදුසුද යන්න තීරණය කරන අතර සුදුසු වන්නේ නම් අදාල නියම හා කොන්දේසිවලට යටත්ව පරිසර ආරක්ෂන බලපත්‍රය නිකුත් කිරීම.

05. පාරිසරික ආරක්ෂන ක්‍රියාවලියට අනුව කර්මාන්තය පවත්වාගෙන යන්නේද පිළිබදව පසු විපරම් සිදු කිරීම.

ඇමුණුම

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 05 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 05 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර/මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර 200ට අඩු නිශ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල් තෙල් හා ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10ට අඩු නිශ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100ට අඩු නිශ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිශ්පාදනය කිරීමේ හෝ බොතල්ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිශ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000ට අඩු නිශ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොල වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිශ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 05ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 05ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ /මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින නිශ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝ ග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිශ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
20. ගබඩා ධාරිතාව ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පලතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිශ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිශ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පොරණු
24. සේවක සංඛ්‍යාව 5ට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස් " අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ /පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිශ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කලු ගල් කැපීමේ හා ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරන කැණීම් කටයුතු

30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහුකාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්
35. විසිරි පින්තාරු කිරීම හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම් නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම්(කන්ටේනර්)පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇත්ලතු නොවන මුද්‍රණාල හා අකුරු මුද්‍රනය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ "ඈ" කොටසේ ඇතුලත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් /කර්මාන්තයක්

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත

# පාරිසරික ආරක්ෂණ බලපත් ඉල්ලුම් පත්‍රය

කාණ්ඩය : ඉල්ලුම්පත් අංකය :......................................................

වර්ගය : දිනය :......................................................

---

කර්මාන්තයේ නම :

කර්මාන්තයේ වර්ගය හෙවත් ප්‍රකාරය : යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කිරීම / කොටස් එකලස් කිරීම / නියම ලෙස මිශ්‍ර කිරීම / නැවත ඇසිරීම / ක්‍රියාවලි / වෙනත්

(නිශ්චිතව සඳහන් කරන්න.)

ඉල්ලුම්කරුගේ නම :

ලිපිනය :

දූරකථන අංකය :

**1. කර්මාන්ත සම්බන්ධ සාමාන්‍ය විස්තර**

1.1 කර්මාන්තයේ ස්වභාවය :

1.2 කර්මාන්තය පිහිටි ස්ථානය :

(පිහිටීම සම්බන්ධ සිතියමක් සහ මාර්ග සලකුණු සහිතව එම ස්ථානයට පැමිණිය හැකි මාර්ගය පැහැදිලි කරන සටහනක් යා කරන්න.)

ලිපිනය:

1.3 පළාත් පාලන ආයතනයේ නම :

1.4 මෙම පිහිටීම ඇත්තේ අනුමත කාර්මික කලාපයක් (Industial Zone) තුළද?

1.5 මූලික ආයෝජන ප්‍රමාණය

දේශීය මුදල් : රු.

විදේශීය මුදල් : රු.

1.6 නිෂ්පාදන ආරම්භ කරන ලද දිනය :

1.7 දිනකට වැඩ මුර සංඛ්‍යාව සහ වේලාවන් :

1.8 එක් එක් වැඩ මුරය තුළ සේවය කරන සේවක සංඛ්‍යාව :

1.9 කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය සහ පිහිටුවීම සඳහා ප්‍රාදේශීය සභා හෝ රාජ්‍ය ආයතනවලින් ලබා ගන්නා ලද අවසරය සම්බන්ධ ලේඛනයක්. (කරුණාකර ඡායා පිටපත් අමුණන්න.)

| | නම | අවලංගු වන දිනය | නිකුත් කරන දිනය |
|---|---|---|---|
| අ | | | |
| ආ | | | |
| ඇ | | | |
| ඈ | | | |
| ඉ | | | |

1.10 කි.මී. 5ක අර්ධවිශ්කම්භය තුළ ප්‍රදේශයේ ඉඩම් භාවිතය-

නේවාසික/ වාණිජ/ කෘෂිකාර්මික/ හිස් ඉඩම්/ විවෘත අවකාශයක්/ ප්‍රසිද්ධ ප්‍රදේශයක් / වගුරුබිම්/ ලවන සහිත වගුරුබිම්/ කඩොලාන/ ස්වාභාවික වනාන්තර/ වෙනත් ( සඳහන් කරන්න.)

1.11 කි.මී. 2ක විශ්කම්භයක් තුළ දැනට පවතින කර්මාන්ත/ ආයතන/ කෘෂිකාර්මික බිම් සම්බන්ධ ලේඛණයක්:

1.12 ප්‍රතිකර්ම පද්ධතියක් (Treatment Plant) සඳහා ඇති ඉඩ ප්‍රමාණය:

## 2. නිෂ්පාදන ක්‍රියාවලිය

2.1 නිෂ්පාදනය කරන ප්‍රධාන භාණ්ඩවල ලේඛණයක් සහ ධාරිතාවයන්:

2.2 අතුරු නිෂ්පාදන ලැයිස්තුව:

2.3 ක්‍රියාවලියේ විස්තර:

2.3.1 භාවිතා කරන ක්‍රියාවලි සම්බන්ධව කෙටි විස්තරයක් (ක්‍රියාවලි ප්‍රවාහ රූප සටහන Process Flow Diagram) අමුණන්න.

2.3.2 භාවිතා කරන අමුද්‍රව්‍ය :

(නිෂ්පාදනයේ සෑම අවස්ථාවකදීම දිනකට භාවිත කරන අමුද්‍රව්‍ය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.)

2.3.3 භාවිත කරන රසායන ද්‍රව්‍ය:

| රසායන ද්‍රව්‍යයේ නම | වෙළඳ නාමය | දිනකට භාවිත කරන ප්‍රමාණය (කි.ගෑම් වලින්) |
|---|---|---|

2.3.4 ඕනෑම හානිකර/ විෂදායක/ ගිනිගන්නා සුළු/ පුපුරන සුළු ද්‍රව්‍ය ප්‍රවාහනය සහ හැසිරවීම සම්බන්ධව යොදා ඇති පූරුවෝපායයන්:

2.3.5 හානිකර/ විෂදායක/ ගිනිගන්නා සුළු/ පුපුරණ ද්‍රව්‍ය සඳහා ගබඩා පහසුකම්:

2.3.6 ගිනි නිවීම සඳහා ප්‍රමාණවත් උපකරණ ඔබ ළඟ තිබේද?

2.3.7 එසේ නම් එබඳු උපකරණ සම්බන්ධ විස්තර:

# 3. ජලය

3.1 ජලය- අවශ්‍යතාවය:

| | | |
|---|---|---|
| නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා | : | දිනකට ඝන මීටර් |
| සිසිල් කිරීම සඳහා | : | දිනකට ඝන මීටර් |
| සේදීම සඳහා | : | දිනකට ඝන මීටර් |
| ගෘහස්ථ ක්‍රියාවලි සඳහා | : | දිනකට ඝන මීටර් |

3.2 ජලය ලබාගන්නා ප්‍රභවයන් ( Sources)

1. පොදු ජල සැපයුම :

2. භූගත ජලය (ළිං, උල්පත්)

3. මතුපිට ජලය (ඇළ, දොළ, ගංගා)

3.3 සම්පූර්ණ දෛනිකව මුදා හැරීම : දිනකට ඝණ මීටර්

3.4 මුදාහැරීමේ ක්‍රමය, විවෘත ඇළ මාර්ග/ නල මාර්ග මගින්/ වසන ලද කාණු/ වෙනත්:

3.5 අපවිත්‍ර ජලය මුදාහරින අවසන් ස්ථානය: කෘෂිකාර්මික භූමියක්/ වගුරු බිමක්/ කසල බැස යන කාණුවක්/ වැවක්/ ගංගාවක්/ ඇළක්/ ගං මෝයක්/ මුහුදට/ වෙනත්

3.6 මුදාහරින වෙනත් විශේෂ විෂදායක ද්‍රව්‍ය මොනවාද? ( ස්වාභාවය සහ සාන්ද්‍රණය) සඳහන් කරන්න. උදා: අකාබනික සහ කාබනික ද්‍රව්‍ය පලිබෝධ නාශක ඇතුළත්ව, කාබනික ක්ලෝරීන් සංයෝග, බැර ලෝහ යනාදිය.

3.7 අපවිත්‍ර ජලය ප්‍රතිකර්මයට භාජනය කරන ක්‍රම. ( ප්‍රතිකර්ම ක්‍රියාවලිය සම්බන්ධ රූප සටහනක් අඩංගු කළ යුතුයි)

3.8 ප්‍රතිකර්මයට පෙර සහ පසු, අපවිත්‍ර ජලයේ ආවේණික ගුණාංග වාර්තා කිරීමට යොදා ඇති ක්‍රම:

3.9 ජලය නැවත භාවිත කරන්නේ නම් නැතහොත් චක්‍රීකරණයට භාජනය කරන්නේ නම් ඒ සම්බන්ධ විස්තර:

## 4 ඝණ අපද්‍රව්‍ය (Solid Waste)

4.1 ඝණ අපද්‍රව්‍යවල ස්වභාවය සහ වර්ගය:

4.2 ඝණ අපද්‍රව්‍යවල සම්පූර්ණ ප්‍රමාණය (දිනකට කි. ග්‍රෑම්:)

4.3 ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම - නාගරික එකතු කිරීමේ ක්‍රමය/ බිම් පිරවීම/ දහනය/ කොම්පෝස්ට් කිරීම/ විකිණීම/ චක්‍රීකරණය

## 5. වායූ ගෝලීය මෝචනයන් (atmospheric emissions)

වායූ ගෝලයට කිසියම් මෝචනය කිරීමක් ඇද්ද? ඔව් / නැත

එසේ "තිබේ නම්" පහත සඳහන් දෑ සම්පූර්ණ කරන්න.

5.1 සිදුවිය හැකි මෝචනයන්:

අ. නයිට්‍රජන්වල ඔක්සයිඩ් වර්ග:

ආ: සල්ෆර්වල ඔක්සයිඩ් වර්ග:

ඇ. දූවිලි සහ දැලි:

ඈ. වෙනත් ද්‍රව්‍යයන්:

5.2 දුම් කවුළු / චිමිනි සංඛ්‍යාව:

උස:

## 6. ඔබේ කර්මාන්තයෙන් දුගඳ සම්බන්ධ ප්‍රශ්න ඇති කරනවාද?

එසේ "තිබේ නම්":

ප්‍රභවය (source)

මැඩ පවත්වාගත හැකි ක්‍රම:

## 07. ශබ්ද දූෂණය

7.1 ඔබේ කර්මාන්තයෙන් ශබ්ද දූෂණයක් ඇති කෙරේද? ඔව්/නැත

7.2 එසේ "තිබේ නම්":

ප්‍රභවය (source)

මැඩපවත්වාගත හැකි ක්‍රම:

## 8. බලශක්ති අවශ්‍යතාවයන් (Energy)

අ. උත්පාදන යන්ත්‍රයක් මගින් ( කි. වොට් පැය වලින්)

ආ. පොදු විදුලි සැපයුම් මගින් (කි. වොට් පැය වලින්)

8.2 කර්මාන්තයේ භාවිතා කරන යන්ත්‍රවල විස්තර සහ ඒවායේ අශ්ව බල ප්‍රමාණයන්:

8.3 භාවිත කරන ඉන්ධන වර්ගය:

අ. භාවිතා කරන්නනේ කුමක් සඳහාද?

ආ. දෛනික පරිභෝජනය:

## 9. චක්‍රීකරණය / නැවත පාවිච්චිය:

9.1 ඕනෑම අපද්‍රව්‍යයක් නැවත පාවිච්චිය සඳහා ලබා ගත හැකි ප්‍රමාණය නිශ්චිතව සඳහන් කරන්න.

## 10. කර්මාන්තය පුළුල් කිරීම

අනාගතයේදී කර්මාන්තය පුළුල් කිරීම ගැන ඔබේ සැලසුම් විස්තර කරන්න. යෝජිත පුළුල් කිරීමේදී නිෂ්පාදන ක්‍රියාවලිය, අමුද්‍රව්‍ය පාවිච්චිය සහ නිමි භාණ්ඩ වෙනස් කිරීමට බලාපොරොත්තු වන්නේදැයි යන වග සඳහන් කරන්න.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් තොරතුරක් ව්‍යාජ හෝ අසත්‍ය බව සොයාගනු ලැබුවහොත් මාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන බවත් බලපත්‍රය නිකුත් කර ඇත්නම් එය අවලංගු කරන බවත් මම හොඳින් දන්නෙමි.

දිනය .................................... ........................................

ඉල්ලුම්කරුගේ අත්සන

# රසායනික කර්මාන්තවලින් අවශ්‍ය අමතර තොරතුරු

පහත සඳහන් පරිදි සවිස්තර තොරතුරු සැපයිය යුතුවේ.

1. පහසුකම් සහිත ඉඩමේ සිට සැතපුම් භාගයක් ඉක්මවා පැතිර පවත්නා අපසන්දන මුදුහැරීමේ ස්ථාන, ළිං, උල්පත් හා වෙනත් මතුපිට ජලමාර්ග සහ බීමට ජලය ගන්නා ළිං වල පිහිටීම චිත්‍රයෙන් දැක්වෙන දල සිතියමක්.

2. පහත සඳහන් (i) හා (ii) ආශ්‍රිතව එකී පහසුකම් ඇති ස්ථානයේ භාවිත කරනු ලබන ක්‍රියාමාර්ග ව්‍යුහයන් සහ උපකරණ සම්බන්ධ විස්තර:

   (i) රසායන ද්‍රව්‍ය ප්‍රවාහනයේදී සහ බෑමේ ක්‍රියාවලියන්හිදී අනතුරු වළක්වාලීම

   (ii) රසායන ද්‍රව්‍යවලට පුද්ගලයින් අධික ලෙස නිරාවරණය වී වැළැක්වීම (ආරක්ෂක ඇඳුම් ආදිය)

3. පහත සඳහන් කරුණු ගැන විස්තර:

   (i) රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම නිසා හදිසි ගිනි ගැනීම් වළක්වාලීම සම්බන්ධයෙන් පූර්වෝපායන්

   (ii) ප්‍රයෝජනය සඳහා ඇති ගිනි නිවන උපකරණ

   (iii) ගිනි නිවීම ගැන පුද්ගලයින් පුහුණු කිරීම

4. කාර්මික ක්‍රියාවලියේ පාවිච්චියට පෙර රසායන ද්‍රවය ප්‍රමාණය ගබඩා කිරීමේ ක්‍රමය ගැන විස්තරයක්

5. පාවිච්චි කරන ලද රසායන ද්‍රව්‍ය ආපසු ලබාගැනීමට හැකි නම්, එකී ක්‍රමය ගැන විස්තරයක්.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

බලපත්‍ර ඉල්ලුම් අංකය:..............................

කාණ්ඩය:

වර්ගය:

1. ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය:

2. අදාල මාණක සැලසුම්, වාර්තා සහ වෙනත් ලියකියවිලි ලැබුණේද?

3. අමතර තොරතුරු ඉල්ලා සිටියේ නම්, එවැනි ඉල්ලීම් සම්බන්ධව විස්තර.

4. වෙනත් ආයතනයක නිරීක්ෂණයන් ඉල්ලා සිටියේ නම්, එවැනි ඉල්ලීම් සම්බන්ධ විස්තර.

5. බලපත්‍ර සඳහා අවසර දුන්නේද යන වග: ඔව්/ නැත

6. බලපත්‍ර සඳහා අවසර දුන්නේ නම්,

(අ) බලපත්‍ර අංකය : ..........................................................................................

(ආ) බලපත්‍රයේ දිනය : ..............................................................................................

(ඇ) වලංගු කාලය : ..................................................................................................

(ඈ) අවලංගු වන දිනය: ..................................................................................................

(ඉ) අදාල කොන්දේසි අමුණා ඇත. (ඇත්නම්) : .......................................................

7. බලපත්‍රය ප්‍රතික්ෂේප කළේ නම්, ප්‍රතික්ෂේප කිරීමට හේතු:

දිනය: ..........................................

..........................................................

අවසර දෙන නිලධාරියාගේ අත්සන සහ තනතුර

# පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

## වාර්ෂික අළුත්කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

කාණ්ඩය : ඉල්ලුම්පත් අංකය :

වර්ගය: දිනය :

1) කර්මාන්තයේ නම සහ පිහිටීම :-

2) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :-

3) කලින් තිබූ බලපත්‍රයේ අංකය :-

3.1. නිකුත් කරන ලද දිනය :-

3.2 අවලංගු වන දිනය :-

4) අන්තිම බලපත්‍රය නිකුත් කිරීමෙන් පසුව, කර්මාන්තය විශාල කිරීම්/ වෙනස් කිරීම්/ ඕනෑම වෙනස් කිරීමක් (විස්තර සඳහන් කරන්න) :-

5) නිෂ්පාදන ක්‍රියාවලිය/ අමුද්‍රව්‍ය පාවිච්චිය/ නිම් භාණ්ඩ, කිසියම් ක්‍රමයකින් වෙනස් කිරීමක් කළේද යන්න සඳහන් කරන්න :-

6) වර්ෂය තුළ මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කරන ලද පාලන වාර්තා සම්බන්ධ විස්තර :-

7) වෙනත් අමතර තොරතුරු :-

මෙම ඉල්ලුම් පත්‍රයෙන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික වෙමි. මෙහි සඳහන් ඕනෑම තොරතුරක් ව්‍යාජ හෝ අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත්, මාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන බවත් , බලපත්‍රය නිකුත් කර ඇත්නම් එය අවලංගු කරන බවත්, මම හොඳින් දන්නෙමි.

දිනය :- ..........................................

ඉල්ලුම්කරුගේ අත්සන

## කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.

1. බලපත්‍රය අළුත් කරන්නේද - ඔව්/ නැත :-

2. අළුත් කරන්නේ නම් -

   බලපත්‍රයේ අංකය :-

   බලපත්‍රයේ දිනය :-

   වලංගු කාලය :-

   අවලංගු වන කාලය :-

3. බලපත්‍රය අළුත් කිරීම ප්‍රතික්ෂේප කළේ නම් ප්‍රතික්ෂේප කිරීමට හේතු :-

දිනය:- ..................................................

අවසර දෙන නිලධාරීයාගේ අත්සන සහ

තනතුර